# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 21 දරන
# ඩන්කන් වයිට් ක්‍රීඩා පදනම
# (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 21 දරන ඩන්කන් වයිට් ක්‍රීඩා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 98/90

ඩන්කන් වයිට් ක්‍රීඩා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි. පූර්විකාව.

"ඩන්කන් වයිට් ක්‍රීඩා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 21 දරන ඩන්කන් වයිට් ක්‍රීඩා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන ඩන්කන් වයිට් ක්‍රීඩා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ඩන්කන් වයිට් ක්‍රීඩා පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු අතර එම සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධවද සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා එය පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ඩන්කන් වයිට් ක්‍රීඩා පදනම සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථය.

(අ) ශ්‍රී ලංකාව පුරා මලල ක්‍රීඩා වැඩි දියුණු කිරීම, ඒවාට ධෛර්ය දීම, ඒවායේ උන්නතිය ඇතිකිරීම සහ එකී ප්‍රයත්නයෙහි ලා ක්‍රීඩකයන්, නිලධරයන් හා තත් කාලයේ පවත්නා ක්‍රීඩා මණ්ඩල සමග සහයෝගයෙන් කටයුතු කිරීම හා ඔවුන්ට හා ඒවාට උපකාර කිරීම;

(ආ) "ඩන්කන් වයිට් ප්‍රදානය" යනුවෙන් නම් කරනු ලබන ප්‍රදානයක්, සංස්ථාව තීරණය කරන ඔලිම්පික් ක්‍රීඩාවල දී විශිෂ්ඨ දක්ෂකම් දක්වන ක්‍රීඩකයකුට වාර්ෂිකව ප්‍රදානය කිරීම;

(ඇ) සංස්ථාව විසින් තීරණය කරනු ලබන ඔලිම්පික් ක්‍රීඩාවලදී දක්වනු ලබන විශිෂ්ට දක්ෂතා පදනම් කොට ගෙන, යම් නැගී එන ක්‍රීඩකයකුට හෝ ක්‍රීඩකයන්ට "ඩන්කන් වයිට් ශිෂ්‍යත්වය" නමින් හැඳින්වෙන ක්‍රීඩා ශිෂ්‍යත්වය කලින් කල පිරිනැමීම සහ ලබා ගැනීමට ඇති අරමුදල්වලට අනුකූලව, අවශ්‍ය වන පරිදි හා අවශ්‍ය වන අවස්ථාවල දී අතිරේක ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ; සහ

(ඈ) ක්‍රීඩකයන්ට ශ්‍රී ලංකාවේදී සහ විදේශවලදී පුහුණු වීමේ නවීන පහසුකම්, උපකරණ හා ශිල්පීය උපදෙස් සැප සීමෙහිලා උපකාර කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමට අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ඉටු කරගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වුවද ආකාරයක සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදීමේ බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද ඒ රීතිවලින් සලස්වා ඇති සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වන්නා වූ ද භාරකාර මණ්ඩලයක් විසින් එකී රීතිවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දැරූ සංගමයේ භාරකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත සඳහන් කරුණු සියල්ලක්ම හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, නිලධරයන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව හා කාර්ය ;

(ඇ) භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම හෝ තෝරා පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) භාරකාර මණ්ඩලයේ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා ඒ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සහ ඒ රැස්වීම් පවත්වන වේලාවල්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර සහ ඒ රැස්වීම්වල ගණපූරණය හා එහිදී ඉටු කළ යුතු කාර්ය ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම හා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එම පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම එවැනිම රැස්වීමකදී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තා හ.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට සංගමයට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතුව තිබුණු සියලු සම්මාදම් සහ දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය. සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

8. මිළට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපළක් සතු කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ එවකට බලපවත්නා රීතිවලට යටත්ව, ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, සංස්ථාව විසින් දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර, සංස්ථාවේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිටදී මිස එය කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඔවුන් දෙදෙනා විසින් තමන් පැමිණ සිටිය බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිති වාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.